Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023 ජනවාරි 11, කොළඹ

## නෙස්ලේ ලංකා සමාගමේ පොල් ආශ්‍රිත වටිනාකම් දාමයේ කාබන් පිය සටහන, ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (Sri Lanka Climate Fund) විසින් තහවුරු කෙරෙයි

*- 2050 වසර වන විට ශුද්ධ වායු විමෝචනය ශුන්‍ය කිරීම කරා යන ගමනට දායකත්වය දක්වයි*

නෙස්ලේ ලංකා සමාගම, අමුද්‍රව්‍ය සපයාගැනීමේ සිට කුරුණෑගල කර්මාන්ත ශාලාවට ඒවා ගෙනඒම දක්වා වන පොල් ආශ්‍රිත වටිනාකම් දාමයේ විශ්ලේෂණය සාර්ථකව පසුගියදා නිම කළේය. ඒ අනුව, පොල් ආශ්‍රිත වටිනාකම් දාමයේ විශ්ලේෂණය සම්පූර්ණ කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම සමාගම ලෙස, ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (Sri Lanka Climate Fund) විසින් කාබන් පියසටහන් තහවුරු කරගැනීමට (carbon footprint verification) නෙස්ලේ ලංකා සමාගම සමත්විය. මෙම විශ්ලේෂණයේ නිර්දේශ, පොල් ආශ්‍රිත වටිනාකම් දාමයේ වායු විමෝචනය ශුන්‍ය කිරීම සඳහා මෙන්ම, පුනර්ජනනීය කෘෂිකාර්මික පිළිවෙත් දෙසට ගමන් කිරීමට ද මඟපෙන්වීමක් ලෙස උපයෝගී කරගැනීම මගින්, සමාගම 2050 වසර වන විට ශුද්ධ වායු විමෝචනය ශුන්‍ය කිරීම කරා යන ගමනට දායකත්වය දක්වයි.

"මිහිකතට යහපතක් කිරීම සඳහා අපගේ නොසැලෙන කැපවීම පිළිබඳ සාක්ෂි සපයමින්, ශ්‍රී ලංකා දේශගුණික අරමුදල (Sri Lankan Climate Fund) වැනි ගෞරවනීය සංවිධානයකින් කාබන් පියසටහන් තහවුරු කිරීම අපි ලද භාග්‍යයක් ලෙස සලකමු. පොල් යනු අපගේ ප්‍රධාන අමුද්‍රව්‍යයක් බැවින්, අපගේ ශුද්ධ වායු විමෝචන ශුන්‍ය කිරීම කරා යන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස මෙම තහවුරු කිරීම සැලකිය හැකියි. ඒ මගින්, අපගේ පොල් ආශ්‍රිත වටිනාකම් දාමයේ වායු විමෝචනය තවදුරටත් අඩු කිරීමට හැකිවේ. තිරසාර බව අපගේ ව්‍යාපාරයේ ප්‍රමුඛතාවක් ගනියි. එම නිසා, 'යහපත් ආහාර, යහපත් ජීවිතයක්' (Good food, Good life) යන තේමාව පෙරටු කරගෙන අපි, ගොවිබිමේ සිට ආහාර මේසය දක්වා වූ වටිනාකම් දාමය තුළ අපගේ පාර්ශවකරුවන් සමඟ එකට එක්ව කටයුතු කිරීමෙන්, ශුද්ධ වායු විමෝචනය ශුන්‍ය කිරීමට අපගේ ප්‍රයත්න වේගවත් කරමු. ඉදිරියේදී අනෙකුත් වටිනාකම් දාම තුළත් මෙවන් විශ්ලේෂණ සිදුකිරීමට ද අපි බලාපොරොත්තු වෙමු," යනුවෙන් නෙස්ලේ ලංකා හි කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනායා මහතා පැවසීය.

මෙරට පිටිකළ පොල් කිරි අපනයනය කරන විශාලතම සමාගමක් ලෙස නෙස්ලේ ලංකා සමාගම, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථීක සංවර්ධනයට දායක වෙමින් දේශීය පොල් කර්මාන්තය නඟා සිටුවීමට සහ ගොවි ප්‍රජාවන්ට තිරසාර ජීවනෝපායන් නිර්මාණය කිරීමට දායක වේ. 1986 වසරේ දී Maggi Real Coconut Milk Powder හඳුන්වා දීමත් සමඟ,

සමාගම දේශීය පොල් ගොවීන් 8,000කට අධික පිරිසකගේ ජීවනෝපාය සඳහා සහාය වෙයි. 2021 දී සමාගම Maggi Real Coconut Milk Powder නිෂ්පාදනය සඳහා පොල් ගෙඩි මිලියන 94කට අධික ප්‍රමාණයක් ලබා ගනිමින් දේශීය පොල් කර්මාන්තයට රුපියල් බිලියන 6ක දායකත්වයක් දැක්වූ අතර, එම නිෂ්පාදන ලොව පුරා රටවල් 50කට අධික සංඛ්‍යාවක අලෙවි කරමින් විදේශ විනිමය උත්පාදනයට ද දායක විය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 24වැනි ජනාධිපති අපනයන සම්මාන උලෙළේදී, 2019/2020 සහ 2020/2021 මූල්‍ය වර්ෂ සඳහා පොල් මද අංශයේ හොඳම අපනයනකරු ලෙස නෙස්ලේ ලංකා සමාගම මෙරට අපනයන ක්ෂේත්‍රයට දක්වන සුවිශේෂී දායකත්වය ඇගයීමට ලක්විය.

‘වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ’ අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ඉහළ ගුණාත්මකබවින් යුතු සිය ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත. 1906 වසරේ පටන් ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් සිදුකරන නෙස්ලේ ලංකා සමාගම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට බද්ධ වී ඇත. එමෙන්ම 25,000කට වැඩි ශ්‍රී ලාංකික කිරි සහ පොල් ගොවීන් මෙන්ම ගෙවතු වගාකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධනයට දායකවන නෙස්ලේ ලංකා සමාගමේ සෘජු රැකියා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව 800 ඉක්මවයි. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් කර්මාන්තශාලාවේ දැඩි සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි.

---


| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |